අභිමානවත් ශ්‍රී ලාංකීය ව්‍යාපාරික ඔබට
සාර්ථකත්වයේ මාවත උදාකර දෙන්නෙමු
සුන්දර ජීවන වෘත්තියකට
සිතුවිලි තුළින් උපදින්න
LEADERSHIP
INTEGRITY
TRAINING & DEVELOPMENT
SKILLS
LOYALTY
www.facebook.com/manjusritraining

ඔබගේ ව්‍යාපාරයේ සිංහල ලකුණ

දුරාතීතයක පටන් සිංහල අපි ආගන්තුක සත්කාර පිළිබඳ දැරූ කීර්ති නාමය දේශ දේශාන්තරයන් හි ප්‍රචලිතය. එවන් අතීතයකට උරුමකම් කියූ සිංහල ව්‍යාපාරික ඔබ තුළ වන අගනාකම් තුළින් නොමියෙන වෙළඳ නාමයකට හිමිකම් කියන මාවත අපි උදාකර දෙන්නෙමු.

ව්‍යාපාරිකයෙකු ලෙසින් මෙතුවක් ඔබ පැමිණි ගමන් මග නව මානයකින් දකින්නට ඔබගේ ආයතනික සේවා සංස්කෘතියේ හැරැවුම් ලක්ෂයට කාලයයි.

- **ව්‍යාපාරයේ ලාභය දෙගුණ කරගන්න.**
- **කීර්තිමත් ව්‍යාපාරික නාමයක් ගොඩනගන්න.**
- **ඵලදායි කාර්ය මණ්ඩලයකට උරුමකම් කියන්න.**
- **ව්‍යාපාර සංවර්ධනය කඩිනම් කරගන්න.**

ආයතනික පාරිභෝගික සේවා සත්කාරය සහ මහජන සම්බන්ධතා කළමනාකරණය තුළින් කාර්යමණ්ඩලය අභිප්‍රේරණයට කාලයයි.

මානව හිතවාදී ව්‍යාපාරික භූමිකාවක් සමග වෙළඳපළ තුළ මෙතෙක් ඔබ නොදුටු සීමා මායිම් දකින්නට අපි ඔබට පාර කියා දෙන්නෙමු.

නව ලොවක් දකින්නට සිතුවිලි තුළින් උපදින්න

ලොව ඇති සියලු නිර්මාණයන් සිතුවිල්ලක ප්‍රතිඵලයකි. අපගේ අවබෝධයට හසුනොවූ කරුණ නම් ලොව ඇති ප්‍රබලතම බලවේගය නම් කුමක්ද යන්නයි. ඒ අනිකක් නොව **"සිතුවිල්ලයි"** මිනිසා වෙනස් කිරීමේ මහා බලය රැඳී ඇත්තේ සිතුවිලි තුළයි. එබැවින් මිනිස් සිතුවිලි සඳහා ආමන්ත්‍රණය කිරීමෙන් ලොව කළ හැකි දේද අපමණයි. "සුන්දර ජීවන වෘත්තියකට සුබවාදී පරිවර්තනය" හි මූලික වස්තු විෂය සිතුවිලි නම් බලවේගය සමග කරනු ලබන ප්‍රායෝගික පුද්ගල සංවර්ධන ක්‍රියාදාමයකි.

"ඔබ තනන ඔබේ සිතුවිලි හි පාලකයා ඔබම බව අපි ඔබට පසක් කර දෙන්නෙමු."

පාරිභෝගික සේවා
සත්කාරය සහ මහජන
සම්බන්ධතා
කළමනාකරණ වැඩමුළුව
(Customer Service &
Public Relationship
Management)

වෘත්තීය ජීවිතය උදෙසා
ඵලදායී සන්නිවේදන
කුසලතා සංවර්ධන වැඩමුළුව
(Effective Communication
for Career)

කළමනාකරණ කුසලතා,
සුපිළිපන් භාවය සහ
භාවාත්මක බුද්ධි සංවර්ධන
වැඩමුළුව.
(Management Skills, Integrity
& Emotional Intelligence
Development
Workshop)

වෘත්තියමයභාවය සහ වෘත්තීය,
සමාජ හා ව්‍යාපාරික ආචාරධර්ම
සංවර්ධන වැඩමුළුව
(Professionalism,
Social & Business Ethics
Development Workshop)

කාර්ය මණ්ඩල අභිප්‍රේරණ
ප්‍රායෝගික වැඩමුළුව
(Employee Motivation
Practical Workshop)

ගැටලු නිරාකරණ විධික්‍රම,
සමායෝජනය සහ කණ්ඩායම්
හැඟීම් සංවර්ධන වැඩමුලුව
(Complain handling,
Coordination and
Team Spirit building
Workshop)

නායකත්ව සහ පෞරුෂත්ව
සංවර්ධන වැඩමුළුව
(Leadership and Personality
Development Workshop)

අපෙන් ඔබට

වෘත්තීය ආත්ම විශ්වාස
සංවර්ධන වැඩමුළුව
(OBT Training -
Confident Building
Session)

LEADERSHIP
INTEGRITY
TRAINING & DEVELOPMENT
SKILLS
LOYALTY

ව්‍යාපාර සංවර්ධන උපදේශන සේවාව

Business Development Consultation Services

ව්‍යාපාරික ආයතනයක තිරසර වර්ධනයක් උදෙසාත් වෙළඳපොළ අභියෝග සහ ආයතනික අභ්‍යන්තර අභියෝග ජය ගැනීම උදෙසා ව්‍යාපාර සංවර්ධන උපදේශනය සඳහා වර්තමානයේ පැසසිය යුතු ඉඩක් වෙළඳ ලෝකය තුළ ලබාදී ඇත. ආයතනික අභියෝග ජයගැනීමටත් ඵලදායීතාවය මෙන්ම කාර්යක්ෂමතාවය ඉහළ නංවාගනිමින් ලාභය උපරිමව ලබාගනිමින් අවදානම් තත්ත්වයන්ගෙන් මුදවා ව්‍යාපාරය නිවැරදි මග ගෙන යාමට වුවමනා විනය සහ පාලනය සඳහා උපදේශනය මෙහිදී ලබාදෙනු ඇත.

- ව්‍යාපාර සංවර්ධන සැලසුම්
- ක්‍රමෝපායික අලෙවිකරණ සැලසුම්
- මානව සම්පත් සංවර්ධන සැලසුම්
- වෙළඳපල සමීක්ෂණ
- කාර්ය මණ්ඩල පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන්

ලොව ඇති ප්‍රබලතම අවිය අධ්‍යාපනයයි

ජීවන වෘත්තියක සතුට රැගෙන

Happy employee culture

පුද්ගලයාගේ ජීවිතයේ ඒකායන අරමුණු අතර පළමු වැන්න වන්නේ සතුටින් ජීවත් වීමයි. සතුට සොයා යන පුද්ගලයා පෞද්ගලික ජීවිතය තුළ මෙන්ම වෘත්තීය ජීවිතය තුළ ද සතුටින් විසීමට දරණ වෑයම අතිමහත්ය. ජීවන වෘත්තියක සතුට රැකගන්නට සහ ළඟා කර ගන්නට උත්සාහ දරණ කවර වෘත්තිකයෙකු වුවද ස්වකීය අභිමතාර්ථය සපුරාගන්නට දරණ වෑයම අතිමහත් මෙන්ම බොහෝ වෙහෙසකර විය හැකිය.

"සතුටින් සිටින සේවකයා සතුටු පාරිභෝගිකයා තනයි"

යන්න වර්තමාන වෙළඳ ලෝකය තුළ පිළිගන්නා රීතියයි. එබැවින් සතුටින් සිටින වෘත්තිකයෙකු ආයතනය තුළ සිටීම නම් ආයතන අරමුණු මෙන්ම පාරිභෝගික තෘප්තිමත්භාවය උපරිම අයුරින් ජනිත කරමින් ව්‍යාපාරික ඉලක්ක වෙත පහසුවෙන් ආයතනය රැගෙන යාමේ බලවේගයක් ඔහු තුළින් ජනිත වනු ඇත. එබැවින්, සතුටින් සිටින කාර්ය මණ්ඩලයක් තැනීම නම් ආයතනික ඉලක්ක වෙත ඉතා පහසුවෙන් ලගා විය හැකි අති සාර්ථක මාවතක් බව අපගේ විශ්වාසයයි.

තරඟකාරී ලෝකයට වෘත්තීය ජීවිතයේ සුබවාදී පරිවර්තනය

ඔබගේ ව්‍යාපාරය, තරඟකාරී වෙළඳ ලෝකය තුළ ක්‍රියාශීලී ආයතනයක් ලෙසින් තොරතුරු තාක්ෂණය පසුකොට පැමිණි දත්ත තාක්ෂණික යුගය (Data Technology) තුළ වන පරිවර්තනයට මුහුණ දීමට සූදානම් වන්න.

ව්‍යාපාරයක ප්‍රධානතම බලවේගය වන කාර්ය මණ්ඩලයේ නිපුනතාවය සහ කාර්යක්ෂමතාවය කණ්ඩායමක් සේ සාමූහික වගකීම මැනවින් ඉටුවන බව ඔබ විශ්වාස කරන්නේද?

ව්‍යාපාරයක් ගොඩනැගීමේ ප්‍රධාන සාධකයක් වන **"ශ්‍රමය"** වඩා කාර්යක්ෂමතාවයකින් සංවර්ධනය කර ගැනීම ඔබගේ ව්‍යාපාරය සජීවී ලෙසින් තරඟකාරී වෙළඳ ලොවට මුහුණ දීමට කරනු ලබන සැලසුම් අතර විය යුතු එක් වැදගත්ම සැලසුමකි.

"සුන්දර ජීවන වෘත්තියකට සුබවාදී පරිවර්තනය" පුහුණු වැඩමුළුව මගින් ආයතන කාර්ය මණ්ඩලයක සමගිය, සාමූහික වගකීම, ආයතන පක්ෂපාතීත්වය, කණ්ඩායම් හැගීම සහ වෘත්තීය මෙන්ම පෞද්ගලික ජීවිතයේ සුබවාදී පරිවර්තනය පිළිබඳව හැදෑරීමට සැලැස්වීම සැලසුම් කර ඇත.

කවුරුන් සඳහා ද?

- ආයතනයක කළමනාකරුවන්හට හා විධායක අංශයට
- ආයතනයක ඕනෑම තලයක සේවක මණ්ඩලයකට
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි වෘත්තිකයන් හට
- ආයතනයක විශේෂිතව හඳුනාගත් වෘත්තිකයන් කණ්ඩායමකට
- ආකල්ප වෙනස්කළ යුතු යයි කළමනාකාරිත්වය තීරණය කරනු ලබන කාර්ය මණ්ඩලයකට.

සුන්දර ජීවන වෘත්තියකට සුබවාදී පරිවර්තනය

සුබවාදී වෘත්තිකයෙකු වන්න,
සුන්දර මිනිසෙකු වන්න,
සැනසුම ඔබ තුළින් දකින්න
ජීවන වෘත්තියේ
සුබවාදී පරිවර්තන
මාවතට පිවිසෙන්න.

සපුරා ගන්නා අභිමතාර්ථ

- වෘත්තීය ජීවිතයේ සුබවාදී පරිවර්තනය සහ පෞද්ගලික ජීවන සංවර්ධනය.
- වෘත්තිකයෙකු ලෙසින් වන සාමූහික වගකීම, කණ්ඩායම් හැඟීම සහ කණ්ඩායම් නායකත්ව භූමිකාව සංවර්ධනය.
- ආයතන පක්ෂපාතීත්වය ප්‍රවර්ධනය සහ වෘත්තීයමයභාවය, වෘත්තීය සුපිළිපන්භාවය සංවර්ධනය.
- ආයතන සංවර්ධනයට යොමු වන වෘත්තීය මානසිකත්වය සහ ඵලදායිතාවය ප්‍රවර්ධනය.
- පෞරුෂත්ව සංවර්ධනය.
- මානව හිතවාදී වෘත්තිකයන් පිරිසක් නිර්මාණය.

පාරිභෝගික සේවා විශිෂ්ටත්වය උදෙසා පාරිභෝගික සේවා සත්කාරය සහ මහජන සම්බන්ධතා කළමනාකරණය

වත්මන් පාරිභෝගික සමාජයේ පාරිභෝගික අවශ්‍යතා නිරන්තරයෙන් වෙනස් වනු ඇත. පාරිභෝගික තෘප්තිමත්භාවය උදෙසා පාරිභෝගිකයා ආයතනයට පැමිණි මොහොතේ සිට ආයතනයෙන් පිටව යන තෙක් ඔහු පිළිබඳව වන අවධානය සහ ඔහු වෙත සපයනු ලබන සේවාදාමය ආයතනයක ප්‍රතිරූපය මෙන්ම පාරිභෝගික සේවාවේ විශිෂ්ඨත්වය පෙන්වනු ලබන කැඩපතක් බඳුය. එබැවින්, පාරිභෝගික සේවා සත්කාරය හා විධිමත් මහජන සම්බන්ධතා කළමනාකරණය පිළිබඳ අවබෝධය ආයතනයක කාර්යක්ෂමතාවයට අවශ්‍ය වන්නේ ඔබ ආයතනයේ වැදගත්ම පුද්ගලයා වන "පාරිභෝගිකයා" රැකගනිමින් සාර්ථක ඉලක්කයක් කරා ඔබගේ ආයතනය ගෙන යනු ලබන ක්‍රියාදාමය ඵලදායී අයුරින් සිදු කිරීමටයි.

"පාරිභෝගික සේවා විශිෂ්ඨත්වය උදෙසා පාරිභෝගික සත්කාරය සහ මහජන සම්බන්ධතා කළමනාකරණය" පුහුණු වැඩමුළුව මගින් තරඟකාරී ආර්ථිකයක් තුළ කාර්යබහුලව සිටින ආයතනයන්හි පාරිභෝගික සේවාව හා සම්බන්ධ කාර්යමණ්ඩලයට මෙම විෂය පිළිබඳව විෂයානුබද්ධ සහ ප්‍රායෝගික පුහුණුවක් තුළින් අදාළ විෂය දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනයත් විධිමත් මහජන සම්බන්ධතාවයක් උදෙසා ඵලදායී සන්නිවේදන ක්‍රමයන් පිළිබඳ මූලික අවබෝධයක් ලබාදීමට සැලසුම් කර ඇත.

අරමුණු

- ආයතනයක් තුළ පාරිභෝගික සේවා විශිෂ්ඨත්වයේ අත්‍යවශ්‍ය බව හා වැදගත්කම හඳුන්වාදීම.
- විශිෂ්ඨ පාරිභෝගික සේවාවක් ගොඩනැගීමට ගුණාත්මක ප්‍රමිතීන් හඳුන්වා දීම.
- අනිකුත් තරඟකාරී සමාගම් අතර පාරිභෝගික සේවා සත්කාරය තුළින් හා මහජන සම්බන්ධතා තුළින් ඉදිරියෙන්ම සිටින සමාගමක් වීම උදෙසා කාර්ය මණ්ඩලය තුළ ගුණාත්මක ප්‍රමිතීන් හා ආකල්ප සංවර්ධනය.
- විශිෂ්ඨ පාරිභෝගික සේවා සත්කාරයක් උදෙසා විධිමත් සහ ඵලදායී සන්නිවේදනය හඳුන්වාදීම.
- පාරිභෝගික තෘප්තිමත්භාවය වර්ධනය කරගැනීමට ක්‍රමවේද හඳුනාගැනීම.
- මහජන සම්බන්ධතා ප්‍රවර්ධනයට කාර්යමණ්ඩලය දිරිගැන්වීම හා එහි ප්‍රතිලාභ හඳුනාගැනීම.

අන්තර්ගතය

- පාරිභෝගිකයාගේ ස්වභාවය, පාරිභෝගික සේවා මූලධර්ම හා ඉතිහාසය
- පාරිභෝගික සත්කාරය සහ මහජන සම්බන්ධතා කළමනාකරණ මූලධර්ම හා ප්‍රායෝගික භාවිතය.
- පාරිභෝගික සේවා සහ මහජන සම්බන්ධතාවය උදෙසා සන්නිවේදනය.
- ආයතනික හා වෘත්තීය සංවර්ධනය උදෙසා මහජන සම්බන්ධතා ප්‍රවර්ධනය.

කවුරුන් සඳහාද?

රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතනයන්හි පාරිභෝගික සේවාව හා සම්බන්ධ කාර්ය මණ්ඩලයට, පාරිභෝගික සේවා අංශයේ රැකියා අපේක්ෂිත පුද්ගලයන් හට.

අභිමානවත් ශ්‍රී ලාංකීය ව්‍යාපාරික ඔබට සාර්ථකත්වයේ මාවත උදාකර දෙන්නෙමු..

මංජු ශ්‍රී පාලිත

ව්‍යාපාර සංවර්ධන උපදේශක
වෘත්තිය කුසලතා හා ආකල්ප සංවර්ධන උපදේශක

මංජු ශ්‍රී පාලිත, කුසලතා හා පුද්ගල ආකල්ප සංවර්ධන උපදේශකයෙකු ලෙසත් ව්‍යාපාර සංවර්ධන උපදේශකයකු ලෙසත් සිය වෘත්තිය මෙහෙයවනු ලබන පෞද්ගලික ක්ෂේත්‍රයේ මෙන්ම ජනමාධ්‍ය ක්ෂේත්‍රය ඇතුලු අංශ බොහොමයක වසර විස්සක් ඉක්ම වූ සේවා පළපුරුද්දක් ජාතික මෙන්ම ජාත්‍යන්තර තලයේ ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සේවා පළපුරුද්දක් ඇති වෘත්තිකයෙකි.

බාහිර කථිකාචාර්යවරයෙකු ලෙසින් සිසුන් බොහෝ දෙනෙකුගේ නෙත් පෑදූ මංජු ශ්‍රී පාලිත වෘත්තීය නිවේදන ශිල්පියෙකු ලෙසත් සාහිත්‍ය වේදියෙකු ලෙසත් කටයුතු කළ නිර්මාණකරුවෙකුද වේ. නිර්මාණාත්මක සන්නිවේදන කලාවක් බිහි කළ මංජු ශ්‍රී, විද්‍යුත් මාධ්‍ය තුළ පුද්ගල කුසලතා හා ආකල්ප සංවර්ධන වැඩසටහන් බොහොමයක් මෙහෙය වූ සම්පත් දායකයෙකි.

ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ (FCCISL) ජාතික වැඩස-ටහන් සම්බන්ධීකාරකයෙකු ලෙසින් ශ්‍රී ලාංකීය ව්‍යාපාරික හා ව්‍යවසායක ප්‍රජාව සමගත් පළාත් හා දිස්ත්‍රික් වාණිජ මණ්ඩල සමගත් ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘති බොහොමයකට දායක වූ මංජු ශ්‍රී පාලිත වෙළඳ සහ අලෙවි ක්ෂේත්‍රයේ ජාතික තලයේ මෙන්ම ජාත්‍යන්තර තලයේ අත්දැකීම් ඇති ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාල තුළින් සිය ප්‍රථම හා පශ්චාත් උපාධි ලබා ඇති මංජු ශ්‍රී පාලිත ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය තුළත් සිය අධ්‍යයනයන් සිදු කර ඇත. පුහුණුකරුවෙකු වශයෙන් ජාතික මෙන්ම ජාත්‍යන්තර තලයේ විශේෂ පුහුණුවක් මෙන්ම පළපුරුද්දක්ද ලබා ඇති කීර්තිමත් උපදේශකයෙකි.

LEADERSHIP
INTEGRITY
TRAINING & DEVELOPMENT
SKILLS
LOYALTY

+94 718 102 606
manjusrip1@gmail.com
www.facebook.com/manjusritraining
www.manjusripalitha.com